# රුහුණ විශ්වවිද්‍යාලය - මාතර

## මනෝවිද්‍යාත්මක උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2017

රුහුණ විශ්වවිද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය සහ සමාජවිද්‍යා අධ්‍යයනාංශය මගින් මෙහෙයවනු ලබන මනෝවිද්‍යාත්මක උපදේශනය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

1. පාඨමාලාවේ නම : මනෝවිද්‍යාත්මක උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
2. කාලය : මාස 12
3. මාධ්‍යය : සිංහල
4. ඉලක්කගත කණ්ඩායම් : සමාජ සුබසාධන, ප්‍රජා සංවර්ධන, ආරක්ෂක, සෞඛ්‍ය, ගුරු වෘත්තියේ හා උපදේශන ක්ෂේත්‍රයේ රැකියාවක නිරතවූවන්ට හා එම ක්ෂේත්‍රයෙහි රැකියා අපේක්ෂා කරන්නන්ට, උපදේශනය පිළිබඳ වැඩිදුර අධ්‍යාපනය ලැබීමට අපේක්ෂා කරන්නන්ට
5. සුදුසුකම් : එක් වරක දී අවම වශයෙන් විෂයන් 03 ක් සහිතව අ.පො.ස. උසස් පෙළ සමත්වීම.

   **හෝ**

   පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් උසස් සහතිකපත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම හා විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන අභියෝග්‍යතා පරීක්ෂණයකින් සමත් වීම.

   **හෝ**

   රුහුණ විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මඟින් පිළිගනු ලබන අ.පො.ස. උසස් පෙළ විභාගයට සමාන විභාගයකින් සමත් වී තිබීම.
6. පාඨමාලාව පැවැත්වෙන දිනයන් : සෙනසුරාදා දින පෙ.ව. 08.00 - ප.ව. 05.00 දක්වා
7. පාඨමාලා ගාස්තු : රුපියල් 55,000.00
8. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය : **2017.11.10**

අයදුම්පත් ලබා ගැනීම සඳහා මහජන බැංකුවේ රුහුණ විශ්වවිද්‍යාල ශාඛාවේ අංක **032-1-001-1-2477594** දරණ ජංගම ගිණුමට ඕනෑම මහජන බැංකු ශාඛාවකින් රු. 500.00 ක මුදලක් බැරකොට ලබාගත් රිසිට් පත සමග 2017/11/09 දිනට පෙර ලිපිනය සඳහන් කරන ලද රු. 15.00 ක මුද්දර ඇල වූ ලියුම් කවරයක් සම්බන්ධීකාරක, මනෝවිද්‍යාත්මක උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව, සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර. යන ලිපිනයට එවීමෙන් හෝ පැමිණ ලබාගත හැකිය. අයදුම්පත් එවන ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ **"මනෝවිද්‍යාත්මක උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව"** යනුවෙන් සඳහන් කරන්න. වැඩි විස්තර සඳහා 041 - 3490621 අංකයට ඇමතීමෙන් හෝ www.dceu.ruh.ac.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකිය.

ලේඛකාධිකාරි,

රුහුණ විශ්වවිද්‍යාලය,

මාතර.

2017.09.20